*සැ. යු.-* 2022.05.20 දින පළ වූ අංක 2281 *ගැසට්* පත්‍රයේ I : II (අ) II, III, IV (අ) සහ IV (ආ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,282 - 2022 මැයි මස 27 වැනි සිකුරාදා - 2022.05.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... ... | 470 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.-* (i) විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2022 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2022 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 ජූනි මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූනි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

### මාතලේ දිසා අධිකරණයේ දී ය

නඩු අංකය - DDR/1202/2018
ඇස්කීසි අංකය - 14/2022

1994 අංක. 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් හා සම්බන්ධ කාරණය පිළිබඳවයි.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.

*පෙර නාමය :*

පීපල්ස් ලීසිං කම්පැනි පී. එල්. සී.
අංක. 1161,
මරදාන පාර,
කොළඹ 10.

.................*පැමිණිලිකරු.*

*එදිරිව*

(01) වත්තේ ගෙදර චානක සඳ නුවන් රාජපක්ෂ
අංක 80/2, රජ වීදිය,
මාතලේ

........................*විත්තිකරු.*

ඉහත නම් සඳහන් විත්තිකරු වෙතටයි.

වර්ෂ 2018 ක් වූ ජනවාරි මස 09 දින කොළඹ දිසා අධිකරණයේ අතිරේක දිසා විනිසුරු ලක්මාලි හේවාවසම් මැතිණිය ඉදිරිපිට දී සුදුස්සක් කිරීමට ඉදිරිපත් වූ අවස්ථාවේ පැමිණිල්ලද සමග අමුණා ඇති ලියවිලි ද සලකා බැලීමෙන් පසු පැමිණිලිකාර ආයතනයේ බලයලත් නිලධාරියෙකු විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයේ අඩංගු ප්‍රකාශයන් පිළිබඳව සෑහීමකට පත්ව ආඥා කොට තීන්දු ප්‍රකාශ කරන වගනම්,

එනම්, 2018.08.30 දිනට ශ්‍රී ලංකා මුදලින් රුපියල් හැත්තෑ හතර ලක්ෂ හැටහත්දහස් හත්සිය හතළිස් තුනක (රු. 7,467,743/-) මුදලක් හා එකී වූ මුදලින් ප්‍රාග්ධන ණය මුදල ලෙස අයවිය යුතු රු. 6,200,000/- ක මුදලක් මත 2018.08.31 දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වර්ෂයකට 23% ක් බැගින් වූ බලාත්මක පොළී ප්‍රතිශතයක් මත ගණනය කළ පොළිය ද, තීන්දු ප්‍රකාශිත දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම වන තෙක් තීන්දු ප්‍රකාශිත සම්පූර්ණ මුදල මත 23% ක වාර්ෂික පොළී ප්‍රතිශතයක් මත ගණනය කළ පොළියද එම මුදල අයකර ගැනීම සඳහා 1994 අංක 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතෙන් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව විත්තිකරුට විරුද්ධව ඇතුලත් කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශය අනුව නඩු ගාස්තුද ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවටද,

ඉහත විත්තිකරු විසින් තීන්දු ප්‍රකාශය අනුව කටයුතු කිරීම පැහැර හැර ඇති බැවින් එකී නඩුවේ ක්‍රියාවේ යෙදීමේ ඇස්කීසි බලපත්‍රය නිකුත් කළ අධිකරණයේ නැවත වැඩිදුර ආඥාවක් ලැබෙන තෙක් මෙයට යාකොට ඇති උපලේඛනයේ සඳහන් නිශ්චල දේපල යම් ලෙසකින් පැවරීම, අන්සතු කිරීම, වැය බැරකොට යටත් කිරීම ඒ සම්බන්ධ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ එසේ කිරීමට උපදෙස් දීම එකී විත්තිකරුවන් වන ඔබට තහනම් කරන බව හා එයින් වලක්වන බවද එම ඉඩම හෝ ඉන් කොටසක් මුදලකට හෝ තෑගි වශයෙන් අන් ක්‍රමයට ලබා ගැනීම සියල්ලන්ටම තහනම් කරන බව හා ඔබට සහ ඔබලාට මෙයින් දැනුම් දෙනු ලැබේ. තව ද, මෙම ඉඩමට අදාලව යම් උගස්කර ඇත්නම් එම උගස්කරයන්ට යටත්ව එකී ඉඩම සහ එම ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ සහ පළතුරු ආදී සියල්ලම තහනමට ලක්වේ.

තවද, එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට එකී විත්තිකරු අපොහොසත් වී/පැහැර හැර ඇති හෙයින්, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම් සඳහන් විත්තිකරුට අයිතිය යටතේ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාල සෑම සියලු දේ, කොළඹ දිසා අධිකරණයෙන් මා වෙත නිකුත් කරන ලද ඇස්කීසිය මත මෙම ඉඩමට අදාලව යම් උකස්කර ඇත්නම් එම උකස්කරයන්ට යටත්ව මාතලේ දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්

වන මා විසින් වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 18 වන දින, නිසිලෙස තහනම් කරන ලද පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2022 ක් වූ ජූනි මස 17 වැනි දින පස්වරු 1.30 ට** එකී දේපල පිහිටා ඇති ඉඩමෙ හි ම මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපලට පිවිසෙන මාර්ගය.-* මාතලේ නගරයේ සිට දඹුල්ල පාර ඔස්සේ කි. මී. 17 පමණ ගොස් මඩවල උල්පොත කඩවීදිය අසලින් වම් පසට හැරී ඇහැළපොල පාර ඔස්සේ මී. 250ක් පමණ ගමන් කළ විට දකුණු පසින් මෙම ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් බාරගනු නොලැබේ.

1. සම්පූර්ණ ගැණුම් මුදලෙන් 25% ක මුදලක් පමණක් ගෙවනු ලබන්නේ නම් ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත ඉහත අංක දරන නඩුවට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

2. පිස්කල් ගාස්තු/වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණු කොට්ඨාශයේ, ගම්පහ සිය පත්තුවේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මාතලේ ප්‍රාදේශීය සභාවට අයත් මඩවල උල්පත ග්‍රාම නිලධාරී වසමේ, නාරංගමුව ගමේ පිහිටි "මහරාජා ඩිවිෂන් ඇහැලේ පොළ එස්ටේට්" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක මහතාගේ අංක 6880 සහ 2002.09.18 වන දින දරන සඳහන් පිඹුරේ සඳහන් කැබලි අංක 01 දරන අක්කර එකයි රූඩ් දෙකයි (අක්. 01, රූ. 02, පර්. 00) ක් විශාලැති ඉඩමට මායිම්.

| | | |
|---|---|---|
| උතුරට | - | අංක 6858 දරන පිඹුරේ කැබලි අංක 01 හි කොටසක් |
| නැගෙනහිරට | - | අංක 6831 දරන පිඹුරේ කැබලි අංක 01 හි කොටසක් හා අඩි 05 ක් පළල පාරද |
| දකුණට | - | අංක 6831 දරන පිඹුරේ කැබලි අංක 01 හි කොටසක් සහ පාර |
| බස්නාහිරට | - | අංක 6858 දරන පිඹුරේ කැබලි අංක 01 සහ පාර |
| දකුණු බස්නාහිරට | - | ඇහැලේපොල සිට මඩවල දක්වා ගමන් ගන්නා ප්‍රාදේශිය සභා පාරද |

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණු කොට්ඨාශයේ, ගම්පහ සිය පත්තුවේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මාතලේ ප්‍රාදේශීය සභාවට අයත් මඩවල උල්පත ග්‍රාම නිලධාරී වසමේ, නාරංගමුව ගමේ පිහිටි "මහරාජා ඩිවිෂන් ඇහැලේ පොළ එස්ටේට්" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක මහතාගේ අංක 6880 සහ 2002.09.18 වන දින දරණ සඳහන් පිඹුරේ සඳහන් කැබලි අංක 01 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ආර්. එම්. ඩී. බණ්ඩාර මහතා විසින් වර්ෂ 2017.01.15 වන දින නැවත මැන සාදන ලද අංක 1450 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 01 දරන අක්කර එකයි රූඩ් එකයි පර්චස් තිස් හත (අක් - 01 රූ-01 පර්-37) ක් විශාලැති

| | | |
|---|---|---|
| උතුරු නැගෙනහිරට | - | එස් වැකුණුගොඩ හිමිකම් කියන මෙම ඉඩමේම ඉතිරි කොටස වෙන් වන අඩි 05 ක් පළල පාර ද, |
| දකුණු නැගෙනහිරට | - | බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක මහතාගේ අංක 6831 දරන පිඹුරේ කැබලි අංක 01 සහ පාර ද, |
| දකුණු බස්නාහිරට | - | ඇහැලේපොල සිට මඩවල දක්වා ගමන් ගන්නා ප්‍රාදේශිය සභා පාරද |
| උතුරු බස්නාහිරට | - | බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක මහතාගේ අංක 6858 දරන පිඹුරේ කැබලි අංක අංක 01ද |

යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ආදී සෑම සියලු දෙයද ඉහත කී අංක 1450 දරන පිඹුරු උතුරු නැගෙනහිර දෙසින් ඇති අඩි 05ක් පළල පාරවශ්‍යතා අයිතියද සමග වේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක. A328/06 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,
මාතලේ.

2022 ක් වූ මැයි මස 05 වැනි දින දී ය.

05-182

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.